# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1992/76 - 2016 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2016.11.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී - 15/2016

**යුද හමුදා පනත (357 වන අධිකාරය)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු (357 වන අධිකාරය වූ) යුද හමුදා පනතේ 29 වන වගන්තිය සහ 155 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1989 ජුනි මස 15 වන දින අංක 562/11 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සහ කලින්කල සංශෝධිත පරිදි වන, 1981 යුද හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය නියෝග, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 10(1) වන නියෝගයේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(ඇ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ යම් නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් ආබාධිත බවට පත්වන්නා වූ ද, (ආ) ඡේදයේ නියමකර ඇති අවම ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති වූ ද, ශ්‍රී ලංකා යුද හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය උප සේවයේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උප සේවයේ යම් නිලධරයකු හෝ නිලධාරිනියක් යුද හමුදා සේවය සඳහා නුසුදුසු බවට යුද හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති විට, සේවයෙන් මුදා හරිනු ලැබීමට පෙර ඔහුගේ හෝ ඇයගේ සේවා කාලය කොපමණක් ද යන්න නොසලකා, 4 වන නියෝගයේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශ්‍රාම වැටුපකට ඒ නිලධරයා හෝ නිලධාරිනිය හිමිකම් ලැබිය යුතු අතර, ඒ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී වසර දහයක (10) ගණන් ගත හැකි සේවා කාලයක් ඔහු හෝ ඇය විසින් සම්පූර්ණ කර ඇති සේ සලකනු ලැබිය යුතු ය.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) (ඇ) ඡේදයේ සඳහන් කර ඇති විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී -

(i) නිලධරයකු සම්බන්ධයෙන් වූ විට ඒ නිලධරයා සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ නිලධරයාට වසය අවුරුදු පනස් පහ (55) සපිරෙන දිනයෙන් අවසන්වන කාල සීමාව ; සහ

(ii) නිලධාරිනියක සම්බන්ධයෙන් වූ විට ඒ නිලධාරිනිය සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ නිලධාරිනියට වයස අවුරුදු හතලිස් පහ (45) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව,

අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ හෝ ඇයගේ ගණන් ගත හැකි සේවා කාලයට එකතු කොට ඒ අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඒ නිලධරයාට හෝ නිලධාරිනියට ප්‍රදානය කළ යුතු ය. නැතහොත් දැනටමත් ප්‍රදානය කර ඇති විශ්‍රාම වැටුප ඒ අනුව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(ඉ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් හෝ ආබාධිත බවට පත්ව ඇති සහ යුද සේවය සඳහා නුසුදුසු බවට යුද හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත යුද හමුදා සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් යම් නිලධරයකුගේ හෝ නිලධාරිනියකගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, (ඇ) ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(ඊ) (ඇ) ඡේදය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකමක් ලබන තැනැත්තකු මෙම නියෝග ක්‍රියාත්මක වන දිනය වන විට ද සේවයෙන් මුදා හරිනු ලැබ ඇති විට, එවැනි තැනැත්තකුට 2014 දෙසැම්බර් මස 17 වන දින සිට බලපවත්වන පරිදි පමණක් අදාළ විශ්‍රාම වැටුප ගෙවීම කළ යුතු වේ.''

(2) එහි 22 (1) නියෝගයේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් ඃ-

(ඇ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ යම් නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් ආබාධිත බවට පත්වන්නා වූ ද, (ආ) ඡේදයේ නියම කර ඇති අවම ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති වූ ද, ශ්‍රී ලංකා යුද හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය උප සේවයේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උප සේවයේ යම් සෙබලකු හෝ සෙබලියක් යුද හමුදා සේවය සඳහා නුසුදුසු බවට යුද හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති විට, සේවයෙන් මුදා හරිනු ලැබීමට පෙර ඔහුගේ හෝ ඇයගේ සේවා කාලය කොපමණක් ද යන්න නොසලකා, 21(2) වන නියෝගයේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශ්‍රාම වැටුපකට ඒ සෙබලා හෝ සෙබලිය හිමිකම් ලැබිය යුතු අතර, ඒ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී වසර දොළහක (12) ගණන් ගත හැකි සේවා කාලයක් ඔහු හෝ ඇය විසින් සම්පූර්ණ කර ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(ඈ) (ඇ) ඡේදයේ සඳහන් කර ඇති විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී -

(i) සෙබලකු සම්බන්ධයෙන් වූ විට ඒ සෙබලා සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ සෙබලාට වයස අවුරුදු පනස් පහ (55) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව ; සහ

(ii) සෙබලියක සම්බන්ධයෙන් වූ විට ඒ සෙබලිය සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ සෙබලියට වයස අවුරුදු හතලිස් පහ (45) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව,

අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ හෝ ඇයගේ ගණන් ගත හැකි සේවා කාලයට එකතු කොට ඒ අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඒ සෙබලාට හෝ සෙබලියට ප්‍රදානය කළ යුතු ය. නැතහොත් දැනටමත් ප්‍රදානය කර ඇති විශ්‍රාම වැටුප ඒ අනුව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(ඉ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් හෝ ආබාධිත බවට පත්ව ඇති සහ යුද සේවය සඳහා නුසුදුසු බවට යුද හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත යුද හමුදා සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් යම් සෙබලකුගේ හෝ සෙබලියකගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, (ඇ) ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(ඊ) (ඇ) ඡේදය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකමක් ලබන තැනැත්තකු මෙම නියෝග ක්‍රියාත්මක වන දිනය වන විට ද සේවයෙන් මුදා හරිනු ලැබ ඇති විට, එවැනි තැනැත්තකුට 2014 දෙසැම්බර් මස 17 වන දින සිට බලපවත්වන පරිදි පමණක් අදාළ විශ්‍රාම වැටුප ගෙවීම කළ යුතු වේ.''.

එල්. ඩී. - බී 16/2016

**නාවික හමුදා පනත (358 වන අධිකාරය)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ 161 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1991 මාර්තු මස 20 වන දින අංක 654/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ කලින්කල සංශෝධිත පරිදි වන, 1981 නාවික හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය නියෝග, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 8(1) වන නියෝගයේ (ඇ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(ඇ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ යම් නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් ආබාධිත බවට පත්වන්නා වූ ද, (ආ) ඡේදයේ නියමකර ඇති අවම ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති වූ ද, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය උපසේවයේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උප සේවයේ යම් නිලධරයකු හෝ නිලධාරිනියක් නාවික හමුදා සේවය සඳහා නුසුදුසු බවට නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති විට, සේවයෙන් මුදා හරිනු ලැබීමට පෙර ඔහුගේ හෝ ඇයගේ සේවා කාලය කොපමණක් ද යන්න නොසලකා, 4 වන නියෝගයේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශ්‍රාම වැටුපකට ඒ නිලධරයා හෝ නිලධාරිනිය හිමිකම් ලැබිය යුතු අතර, ඒ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී වසර දහයක (10) ගණන් ගත හැකි සේවා කාලයක් ඔහු හෝ ඇය විසින් සම්පූර්ණ කර ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(ඈ) (ඇ) ඡේදයේ සඳහන් කර ඇති විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී -

(i) නිලධරයකු සම්බන්ධයෙන් වූ විට ඒ නිලධරයා සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ නිලධරයාට වයස අවුරුදු පනස් පහ (55) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව ; සහ

(ii) නිලධාරිනියක සම්බන්ධයෙන් වූ විට ඒ නිලධාරිනිය සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ නිලධාරිනියට වයස අවුරුදු හතලිස් පහ (45) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව,

අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ හෝ ඇයගේ ගණන් ගත හැකි සේවා කාලයට එකතු කොට ඒ අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඒ නිලධරයාට හෝ නිලධාරිනියට ප්‍රදානය කළ යුතු ය. නැතහොත් දැනටමත් ප්‍රදානය කොට ඇති විශ්‍රාම වැටුප ඒ අනුව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(ඉ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් හෝ අබාධිත බවට පත්ව ඇති සහ නාවික හමුදා සේවය සඳහා නුසුදුසු බවට නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත නාවික හමුදා සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් යම් නිලධරයකුගේ හෝ නිලධාරිනියකගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, (ඈ) ජේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(ඊ) (ඇ) ඡේදය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකමක් ලබන තැනැත්තකු මෙම නියෝග ක්‍රියාත්මක වන දිනය වන විට ද සේවයෙන් මුදා හරිනු ලැබ ඇති විට, එවැනි තැනැත්තකුට 2014 දෙසැම්බර් මස 17 වන දින සිට බලපවත්වන පරිදි පමණක් අදාළ විශ්‍රාම වැටුප ගෙවීම කළ යුතු ය.''.

(2) එහි 19 (1) නියෝගයේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(ඇ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ යම් නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් ආබාධිත බවට පත්වන්නා වූ ද, (ආ) ඡේදයේ නියම කර ඇති අවම ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති වූ ද, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය උප සේවයේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උපසේවයේ යම් නැවියකු හෝ කාන්තා නැවියකු, නාවික හමුදා සේවය සඳහා නුසුදුසු බවට නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති විට, සේවයෙන් මුදා හරිනු ලැබීමට පෙර ඔහුගේ හෝ ඇයගේ සේවා කාලය

කොපමණක් ද යන්න නොසලකා, 18(2) වන නියෝගයේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශ්‍රාම වැටුපකට ඒ නැවියා හෝ කාන්තා නැවියා හිමිකම් ලැබිය යුතු අතර, ඒ විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී වසර දොළහක (12) ගණන් ගත හැකි සේවා කාලයක් ඔහු හෝ ඇය විසින් සම්පූර්ණ කර ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(ඈ) (ඇ) ඡේදයේ සඳහන් කර ඇති විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී,

(i) නැවියකු සම්බන්ධයෙන් වූ විට ඒ නැවියා සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ නැවියාට වයස අවුරුදු පනස් පහ (55) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව ; සහ

(ii) කාන්තා නැවියකු සම්බන්ධයෙන් වූ විට ඒ කාන්තා නැවියා සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ කාන්තා නැවියාට වයස අවුරුදු හතලිස් පහ (45) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව,

අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ හෝ ඇයගේ ගණන් ගත හැකි සේවා කාලයට එකතු කොට ඒ අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඒ නැවියාට හෝ කාන්තා නැවියාට ප්‍රදානය කළ යුතු ය. නැතහොත් දැනටමත් ප්‍රදානය කොට ඇති විශ්‍රාම වැටුප ඒ අනුව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(ඉ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් හෝ ආබාධිත බවට පත්ව ඇති සහ නාවික හමුදා සේවය සඳහා නුසුදුසු බවට නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත නාවික හමුදා සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් යම් නැවියකුගේ හෝ කාන්තා නැවියෙකුගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, (ඈ) ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(ඊ) (ඇ) ඡේදය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකමක් ලබන තැනැත්තකු මෙම නියෝග ක්‍රියාත්මක වන දිනය වන විට ද සේවයෙන් මුදා හරිනු ලැබ ඇති විට, එවැනි තැනැත්තකුට 2014 දෙසැම්බර් මස 17 වැනි දින සිට බලපවත්වන පරිදි පමණක් අදාළ විශ්‍රාම වැටුප ගෙවීම කළ යුතු ය.

11 - 1289/2

---

එල්. ඩී. - බී 17/2016

**ගුවන් හමුදා පනත (359 වන අධිකාරය)**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සහ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමග කියවිය යුතු (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 වන වගන්තිය සහ 155 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2016 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1991 ජනවාරි මස 16 වැනි දින අංක 654/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ කලින් කල සංශෝධිත පරිදි වන, 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික ව්‍යවස්ථා සංග්‍රහය නියෝග, පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 8(3) වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

"(3) (අ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ යම් නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් ආබාධිත බවට පත්වන්නා වූ ද, (2) ඡේදයේ නියමකර ඇති අවම ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති වූ ද, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය උප සේවයේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උප සේවයේ යම් නිලධරයකු හෝ නිලධාරිනියක් ගුවන් හමුදා සේවය සඳහා නුසුදුසු බවට ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත සේවයෙන්

යථා පරිදි මුදා හරිනු ලැබ ඇති විට, සේවයෙන් මුදා හරිනු ලැබීමට පෙර ඔහුගේ හෝ ඇයගේ සේවා කාලය කොපමණක් ද යන්න නොසලකා, 4 වන නියෝගයේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශ්‍රාම වැටුපකට ඒ නිලධරයා හෝ නිලධාරිනිය හිමිකම් ලැබිය යුතු අතර, ඒ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී වසර දහයක (10) ගණන් ගත හැකි සේවා කාලයක් ඔහු හෝ ඇය විසින් සම්පූර්ණ කර ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කර ඇති විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී -

(i) නිලධරයකු සම්බන්ධයෙන් වූ විට ඒ නිලධරයා සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ නිලධරයාට වයස අවුරුදු පනස් පහ (55) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව ; සහ

(ii) නිලධාරිනියක සම්බන්ධයෙන් වූ විට ඒ නිලධාරිනිය සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ නිලධාරිනියට වයස අවුරුදු හතලිස් පහ (45) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව,

අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ හෝ ඇයගේ ගණන් ගත හැකි සේවා කාලයට එකතු කොට ඒ අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඒ නිලධරයාට හෝ නිලධාරිනියට ප්‍රදානය කළ යුතු ය. නැතහොත් දැනටමත් ප්‍රදානය කොට ඇති විශ්‍රාම වැටුප ඒ අනුව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(ඇ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් හෝ ආබාධිත බවට පත්ව ඇති සහ ගුවන් හමුදා සේවය සඳහා නුසුදුසු බවට ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතුන් මත ගුවන් හමුදා සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති (1) (අ) හෝ (1) (ආ) ඡේදයේ සඳහන් යම් නිලධරයකුගේ හෝ නිලධාරිනියකගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, (ආ) ඡේදයේ විධිවිධාන අදාළ විය යුතුය.

(ඈ) (අ) ඡේදය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකමක් ලබන තැනැත්තකු මෙම නියෝග ක්‍රියාත්මක වන දිනය වන විට ද සේවයෙන් මුදා හරිනු ලැබ ඇති විට, එවැනි තැනැත්තකුට 2014 දෙසැම්බර් මස 17 වන දින සිට බලපවත්වන පරිදි පමණක් අදාළ විශ්‍රාම වැටුප ගෙවීම කළ යුතු වේ.''.

(2) එහි 18 (5) නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

''(5) (අ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ යම් නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇතිවූ තුවාල හේතුවෙන් ආබාධිත බවට පත්වන්නා වූ ද, 19(1) නියෝගයේ (ආ) ඡෙදයේ නියම කර ඇති අවම ගණන් ගත හැකි සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති වූ ද, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිත්‍ය බලකායේ, නිත්‍ය උප සේවයේ, ස්වේච්ඡා බලකායේ හෝ ස්වේච්ඡා උප සේවයේ යම් ගුවන් භටයකු හෝ කාන්තා භටයකු, ගුවන් හමුදා සේවය සඳහා නුසුදුසු බවට ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතුන් මත සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති විට, සේවයෙන් මුදා හරිනු ලැබීමට පෙර ඔහුගේ හෝ ඇයගේ සේවා කාලය කොපමණක් ද යන්න නොසලකා, 18(2) වන නියෝගයේ විධිවිධාන සලස්වා ඇති පරිදි විශ්‍රාම වැටුපකට ඒ ගුවන් භටයා හෝ කාන්තා භටයා හිමිකම් ලැබිය යුතු අතර, ඒ විශ්‍රාම වැටුප ගණනය කිරීමේදී වසර දොළහක (12) ගණන් ගත හැකි සේවා කාලයක් ඔහු හෝ ඇය විසින් සම්පූර්ණ කර ඇති සේ සලකනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් කර ඇති විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී -

(i) ගුවන් භටයකු සම්බන්ධයෙන් වූ විට ඒ ගුවන් භටයා සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ ගුවන් භටයාට වයස අවුරුදු පනස් පහ (55) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව ; සහ

(ii) කාන්තා ගුවන් භටයෙකු සම්බන්ධයෙන් වූ විට ඒ කාන්තා ගුවන් භටයා සේවයෙන් මුදා හරිනු ලැබූ දිනයෙන් ආරම්භ වී ඒ කාන්තා ගුවන් භටයාට වයස අවුරුදු හතලිස් පහ (45) සපිරෙන දිනයෙන් අවසන් වන කාල සීමාව,

අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ හෝ ඇයගේ ගණන් ගත හැකි සේවා කාලයට එකතු කොට ඒ අනුව ගණනය කරනු ලබන විශ්‍රාම වැටුපක්, ඒ ගුවන් භටයාට හෝ කාන්තා ගුවන් භටයාට ප්‍රදානය කළ යුතු ය. නැතහොත් දැනටමත් ප්‍රදානය කොට ඇති විශ්‍රාම වැටුප ඒ අනුව ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු ය.

(ඈ) මෙහෙයුම් රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් හෝ ඒ සම්බන්ධ නීතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ඉටු කරමින් සිටිය දී ඇති වූ තුවාල හේතුවෙන් හෝ ආබාධිත බවට පත්ව ඇති සහ ගුවන් හමුදා සේවය සඳහා නුසුදුසු බවට ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලැබ වෛද්‍ය හේතූන් මත ගුවන් හමුදා සේවයෙන් යථා පරිදි මුදා හරිනු ලැබ ඇති 19(1) ඡේදයේ සඳහන් යම් ගුවන් භටයෙකුගේ හෝ කාන්තා ගුවන් භටයෙකුගේ විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී, (ආ) ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ විශ්‍රාම වැටුපක් සඳහා හිමිකමක් ලබන තැනැත්තකු මෙම නියෝග ක්‍රියාත්මක වන දිනය වන විට ද සේවයෙන් මුදා හරිනු ලැබ ඇති විට, එවැනි තැනැත්තකුට 2014 දෙසැම්බර් මස 17 වන දින සිට බලපවත්වන පරිදි පමණක් අදාළ විශ්‍රාම වැටුප ගෙවීම කළ යුතු ය.''.

11 - 1289/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.